ජගත් ජේ එදිරිසිංහ ලියන

# ගිම්හාන සුළඟ

**දොරකඩ** අවහිර වන සේ සිටගෙන සිටියේ අශේන් ය. ඔහු රතුව ගිය දෑසින් ඔරවා මා දෙස බලා සිටියේ ය. පිස්සකු සේ අවුල්ව ගිය කෙසින් යුතු ව වියරු බැල්මකින් මා දවා අලු කරන්නට සැරසී සිටි අශේන් පියවි සිහියකින් නොසිටින්නේ යයි මට සිතුණි.

මම ආපසු හැරී සුනෙත් අයියා දෙස බැලුවෙමි. ඔහු විමතියෙන් බලා සිටිනු මට පෙනුණි. කළයුත්තක් සිතා ගත නොහැකිව මම වාහනයත් ගෙදරත් අතර තැනක නැවතී  අසරණව බලා සිටියෙමි.
සුනෙත් අයියා වාහනයෙන් බසිනු ඒ අතර මම දුටුවෙමි.

"නංගී...." ඔහුගේ හඬ අසෙන මොහොතේ මා සිටියේ පියවි සිහියක නොවී ය.

"නංගි ඔයා....." සුනෙත් අයියා කියන්නට ආ දෙය ගිල ගත්තේ ය. එනමුදු ඔහු මගෙන් අසන්නට තැත් කලේ කුමක් දැයි මම දැන සිටියෙමි.

"නංගී.... ඔයා අපටත් නොකියා මේ නරුමයා එක්ක ආවද....?" සුනෙත් අයියා අසන්නට තැත් කළේ එය බව මට සක් සුදක් සේ පැහැදිලි ය. ඔහු එය නෑසූ එක සහනයකි ඇසුවා නම් එයට දෙන්නට උත්තරයක් කොහින්ද?

සුනෙත් අයියා අඩියට දෙකට මා පසු කර අශේන් වෙතට පැන්නේ ය.

"සුනෙත්.... අනේ එපා සුනෙත්..." අමා කෑ ගසනු මට ඇසුණි.

එ සැණින් සුනෙත් අයියා වැරෙන් අශේන් ගේ මුහුණ හරහා පහරක් එල්ල කළේ ය. ඒ පහර අශේන්ට දරා ගත නොහැකි තරම් වේගවත් එකක් වන්නට ඇත. ඔහු විසිවී ගොස් බිම වැටුණේ ය. සුනෙත් අයියා දෙවන පහරක් එල්ල කරන්නට පෙර මම ඔවුන් අතරට පැන්නෙමි.

"එපා....." මම කෑගැසුවෙමි.

සුනෙත් අයියා එසවූ අත පහළට නොගෙනම මගේ මුහුණ දෙස බැලුවේ ය. ඔහුගේ රතුව ගිය දෑසත් වෙවුලන දෙතොලත් මා සිත තුළ ඇති කළේ බියකි.

"එපා අයියේ... එයා මට වරදක් කළේ නැහැ..." මම සිතට දිරි ගෙන කීවෙමි. "...වරදක් වුණා නම් මමයි වැරදි කාරී...  මමයි එයා හොයාගෙන ආවෙ...."

සුනෙත් අයියාගේ දෙඇස් කෙළවර කෝපයෙන් වෙවුළනු මම දුටුවෙමි.

"සමාවෙන්න අය්යේ..." මම මිමිණුවෙමි.

සුනෙත් අය්යා ගල්රුවක් සේ මදෙස බලා සිටියේ ය. ඔහුගේ දෑසින් කෝපයත් වේදනාවත් අසරණ බවත් මම දැක ගතිමි. ඒ දෑස් කෙළවර කඳුළින් තෙත්ව යනු ද මම දුටුවෙමි.

"ගෙදර ඉන්න බැරි තත්වයක් මතු වුණා නම් ඔයාට තිබුණා මා ගාවට එන්න...." ඔහු කීවේ ය.

"අය්යගෙයි අමාගෙයි  ජීවිත වලට කරදරයක් වෙන්න මට බැහැ අය්යේ...." මම මිමිණුවෙමි.

ඔහු වෙනත් කිසිවක් අසන්නට උත්සාහ නොකළේ ය. සමහර විට මා කියූ දේ ඔහු තේරුම් ගන්නට ඇත.
මොහොතකට පසු ඔහු සුසුමක් හෙළා ආපසු හැරුණේ ය. කරබාගත් හිසින් යුතුව කාරය දෙසට පිය මැන්නේ ය. රියැදුරු අසුන පැත්තේ දොර විවෘත කැ ඔහු කාරයට උඩින් මදෙස බැලුවේ ය.

මට කියන්නට බොහෝ දේ ඔහුගේ සිතේ තිබෙන්නට ඇත. ඒ සියල්ල පිට නොකර තම සිත තුළ ම රඳවා ගන්නට ඔහු තීරණය කරන්නට ඇත.

"අපි යන්නම් නංගි..." ඔහු කීවේ ය. "ගිහින් එන්නම්" යයි කියන්නට ඔහුට නොහැකි විය. ඔහු නැවත නොඑන බව ඒ මොහොතේ මගේ සිත හඬ ගා කීවේ ය.
කාරය පණගන්වා ඉදිරියට යනු මම බොඳව ගිය දෑසින් බලා සිටියෙමි. වාහනය නොපෙනී ගිය පසු මම ආපසු හැරුණෙමි. අශේන් පෙනෙන්නට නොසිටියේ ය. මම දොර දෙස බැලුවෙමි. එය වසා තිබුණි.

"අශේන්... දොර අරින්න..." මම දොර අසළ සිට කෑගැසුවෙමි.

"පළයන්...... උඹ මට එපා...." ඔහු ගෙතුළ සිට කියනු මට ඇසුණි..



**මම විකල්ව ගිය සිතින් යුතුව ඔහු පසු පසින් ගෙට ඇතුළු වූයෙමි. ඔහු කේතලය ලිප තැබුවේ ය. කෝප්ප දෙකකට තේකොල හා සීනි දමා මදෙස බැලුවේ ය. මම ඉවත බලා සිටියෙමි.  තේ වත්කරන හඬත් හැඳි ගානා හඬත් මට ඇසුණි. අනතුරුව ඔහු තේ කෝප්පක්ද අතැතිව මා**

"අශෙන්... මං කියන දේ අහන්න... දොර අරින්න..." මම බැගෑපත් වීමි.
"උඹ උඹේ මස්සිනා එක්කම පළයන් වේ.... බැල්ලි" ඔහු තවත් මොන මොනවාදෝ දොඩවනු මට යන්තමින් ඇසුණි. මම දොර පඩිය මත වාඩි වී හිස දෙදණ අතර රුවා ගතිමි. මට යන්නට තැනක් නැත. ඔහු



දොර නාරින්නේ නම් මෙතැනම සිටිනවා ඇරෙන්නට මේ රාත්‍රියේ මට කළ හැකි යමක් නැත.

රාත්‍රී අන්ධකාරය වසා ඇදන දැඩි සීතළ මා වෙළා ගනිමින් තිබුණි. මම ඇඳ සිටි ජැකට්ටුවට ගුළි වී උණුසුමක් ලබා ගන්නට උත්සාහ කළෙමි.

ආත්මාණුකම්පාව විසින් පෙළා දැමූ සිත හඬා වැටෙයි. මේ තාක් කාලයක් එක රැස් කර ගත් ශක්තිය සිඳී බිඳී විසිර ගොස් ඇත. මට අම්මාත් තාත්තාත් සිහි වෙයි. තාත්තාගේ ආදරණීය දුව මේ මහ රෑ මහ පාලුවේ නිවසක දෙර පඩිය මත වාඩි වී රැය ගෙවන බව තාත්තා දන්වා නම්..! මම ජැකට්ටුව තුළ හිස සඟවා ගෙන ඇති තරම් හැඬුවෙමි. ශාරීරික හා මානසික පීඩාව විසින් හෙම්බත් කරනු ලැබ සිටි මම සීතලේ ගැහෙමින් බොහෝ වේලාවක් නින්දත් නොනින්දත් අතර ගත කළෙමි. රැයේ තුන්වන යාමයේ මට නින්ද යන්නට ඇත.

ජීවිතය පිළිබඳ බියකරු සිහින වැළක් දකිමින් මම නිදාගත්තෙමි.  උදෑසන මා අවදි වූයේ නුහුරු සුවදායක පහසක් නිසාවෙනි. සිටි ඉරියව්වෙන්ම ඇස් ඇර බැලුවෙමි. මගේ දකුණු පසින් මට තුරුළු වී නිදා සිටියේ අශේන් ය. කෝපයත් කළකිරීමත් මුසු හැඟීමක් විසින් පොළඹවනු ලැබූ මම ඔහු පසෙකට තල්ලු කර නැගිටින්නට උත්සාහ කළෙමි. ඔහු නැගිට්ටේ මවිසින් දෙතුන් වතාවක් තල්ලු කරනු ලැබීමෙන් පසුව ය.

කෞෂි.... ඔහු නිදිබර හඬින් මිමිණුවේ ය.

මම ඔහු දෙස නොබලාම නැගී සිටියෙමි. ඔහුද මා අනුව ම නැගිට්ටේ ය.

"මං රෑ බලනකොට ඔයා මෙතන නිදි... මට ඇහැර-වන්න ලෝබ හිතුණා.. ඉතින් මාත් මෙතනටම වෙලා නිදා ගත්තා.." ඔහු සිනාසෙන්නට වෙර දරයි.

මේ මිනිසා දොඩවන්නේ සිහිනයෙන් දැයි මට සිතෙයි. ඊයේ රාත්‍රියේ කිසිදු තෙතමනයක් නැති හිතින් මට දොර වැසුවේ මේ මිනිසාම නොවේ ද?

"යං ඇතුළට.. හොඳට උනුවට තේ එකක් බිව්වහම හොඳයි.. නැත්නම් ඔයාට හෙම්බිරිස්සාවත් හැදෙයි මේ සීතලේ නිදාගෙන.." අශේන් දොර අරින අතර කියයි. ".. මොකද ළමයෝ මාව ඇහැරෙව්වෙ නැත්තෙ...?"

මම විකල්ව ගිය සිතින් යුතුව ඔහු පසු පසින් ගෙට ඇතුළු වූයෙමි.  ඔහු කේතලය ලිප තැබුවේ ය.

